# ශ්‍රී ලංකා අවකාශය තුළ වාර්ගික සහජීවනය පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්

## (සිංහල දෙමළ වාර්ගිකත්වය ඇසුරෙන් කෙරෙන ඓතිහාසික විමර්ශනයක්)

එන්. අයි. නානායක්කාර[1]

තිස් අවුරුදු වාර්ගික යුද කාලසීමාවක් අවසන්කර පශ්චාත් යුද අවධියකට ප්‍රවිෂ්ට ශ්‍රී ලංකා සමාජ සන්දර්භය වර්තමානයේ වාර්ගික සහ ආගමික සංහිඳියාව සහිත ජාතියක් ගොඩනැගීමේ මහා ව්‍යාපාරයක නියැළී සිටියි. වාර්ගික ගැටුමකින් පශ්චාත් යුද සමාජයකට එළඹෙන සෑම සමාජයකම පාහේ ප්‍රධාන කතිකාව බවට පත්ව ඇත්තේ සහජීවනයයි. භෞතික පමණක් නොව සවිඥානික සංහිඳියාව ද සමාජගත කිරීම වැදගත් වන්නේ එය දිගුකාලීන සාමයක පැවැත්මට ඉවහල් වන නිසාවෙනි. මෙවැනි සමාජ වටපිටාවක් තුළ මෙම පර්යේෂණ පත්‍රිකාව යටතේ අධ්‍යයනයට ලක් කරනුයේ ශ්‍රී ලාංකේය ඉතිහාසකරණය සහ ඓතිහාසික සවිඥානිකත්වය තුළ යටපත්ව තිබෙන්නා වූ සිංහල සහ දෙමළ වාර්ගික කොටස් අතර පැවතියාවූ ඓතිහාසික සබඳතාවයන් විශ්ලේෂණාත්මකව අධ්‍යයනය කිරීමටයි. තවදුරටත් පැහැදිලි කරන්නේ නම්, පර්යේෂණ ගැටලුව වශයෙන් අධ්‍යයනය කිරීමට ලක් කරන්නේ, ශ්‍රී ලංකා අවකාශය තුළ අතීතයේදී පැවතියාවූ වාර්ගික සහජීවනය කෙබඳු ස්වරූපයක් ගත්තේද? යන වගයි. ඉතිහාසකරණය සහ ඓතිහාසික සවිඥානිකත්වය මගින් සිංහල දෙමළ වාර්ගික කොටස් එකිනෙකා අර්ථකථන ගන්වා ඇත්තේ අතීතයේ පටන්ම සතුරන්ව සිටි මිථ්‍යාදෘෂ්ටිකයන් ලෙසයි. ජාතිවාදී ඓතිහාසික ආඛ්‍යාන තුළ සිංහල සහ දෙමළ වාර්ගික ජන කොටස් නිරූපණය වී ඇත්තේ එකිනෙකා බැහැර කරමින් හෝ වෛරී සහගත සතුරන් ලෙසයි. අතීත ප්‍රපංචයන් බොහෝදුරට ගවේෂණයට ලක්ව ඇත්තේ ද වර්ගවාදී කියවීම් මත ජනවාර්ගික වෙනස්කම් පෙරටු කරගනිමින් එකිනෙකා බැහැර කරන ඉතිහාසයක් ලෙසයි. මෙලෙස ගොඩනැගී තිබෙන්නා වූ ආවෘත ඉතිහාසය සහ ඓතිහාසික සවිඥානිකත්වය විවෘත කිරීම සහ සංස්කෘතිමය විවිධත්වය තේරුම් ගනිමින් විවිධත්වයට ගරු කරන සමාජයක් උදෙසා මූලාශ්‍ර කියවීම් වැදගත් වේ. 'ශ්‍රී ලංකාවේ ප්‍රජා ප්‍රචණ්ඩත්ව බොහෝවිට පෙනී සිටින්නේ පෞරාණික ඉතිහාසයක් ඇති ඓතිහාසික දෙයක් ලෙසයි. ශ්‍රී ලංකාවේ සිංහල සහ දෙමළ යන ප්‍රජා දෙකම ඔවුන් අතර ඇති සබඳතාව අවම වශයෙන් වසර 2500ක් පසුපසට දිවෙන ඉතිහාසයන් අනුව දකියි (නිසන් සහ ස්ටිරාට්, 2007: පි 3). එකම

[1] සහකාර කතිකාචාර්ය, ඉතිහාසය අධ්‍යයනාංශය, ශාස්ත්‍ර පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

හු ඒකකයක් සම්බන්ධයෙන් වර්ගවාදී කියවීම් යටතේ ගැටුම්කාරී සහ විවාදාත්මක ඓතිහාසික ආඛ්‍යානයන් ගොඩනැගී තිබුණ ද ප්‍රාථමික මූලාශ්‍ර අධ්‍යයනයේදී ඓතිහාසික ගවේෂණවලදී ඉතා අවම වශයෙන් අවධානයට ලක්ව ඇති ඓතිහාසික වාර්ගික සහජීවනය වත්මන් පශ්චාත් යුද ශ්‍රී ලංකාවේ සංස්කෘතික විවිධත්වයට ගරු කරන සංහිඳියාත්මක ඓතිහාසික සවිඥානිකත්වයක් සහිත ජාතියක් නිර්මාණය උදෙසා අත්තිවාරමක් ගොඩනැගීමට පරිශ්‍රමයක් දැරීම පර්යේෂණ අරමුණයි. පර්යේෂණ ගැටලුව සහ පර්යේෂණ අරමුණට අදාළව අනන්‍ය විය හැකි ප්‍රධාන න්‍යායික ගුරු කුලයක් ලෙස ජාතිකවාදය (Nationalism) හා එරික් හොබ්ස්බෝම්ගේ (Eric Hobsbawm) නිර්මිත සම්ප්‍රදායන් (Invention of Traditions ) යොදා ගැනේ.

පර්යේෂණයට අදාළ දත්ත රැස් කිරීමට ප්‍රධාන වශයෙන්ම පුස්තකාල සම්පත් භාවිත කරන ලදි. එහිදී ප්‍රාථමික මෙන්ම ද්විතියික මූලාශ්‍ර අධ්‍යයනයට නතු කරන අතර ගුණාත්මක දත්ත කෙරේ මූලික අවධානය යොමු කර ඇත. ප්‍රාථමික මූලාශ්‍ර වශයෙන් සෙල්ලිපි සහ සාහිත්‍ය මූලාශ්‍ර පරිශීලනය කෙරේ. පර්යේෂණය පුරාවට යොදා ගන්නා විධික්‍රම ක්‍රමවේදාත්මකව සාධාරණීයකරණයට ලක් කරන්නේ නම්, පශ්චාත් - ප්‍රත්‍යක්ෂ මූලවාදී ක්‍රමවේදාත්මක පදනමක් ඔස්සේ දැනුම සම්පාදනය කෙරේ.

සෙල්ලිපි මූලාශ්‍ර වලට අනුව අතීතයේ විසූ විවිධ සංස්කෘතීන්ට අයත් ජනයා සහජීවනයෙන් කල්ගත කළ බවට තොරතුරු ලැබේ. ක්‍රි.ව පළමුවන සියවසේදී පමණ රචනා වූවා යැයි සැලකෙන අභයගිරි විහාරයෙන් සොයා ගැනුණ සෙල්ලිපියෙහි බුද්ධශාසනයේ පැවිදිව සිටි දෙමළ ජාතික භික්ෂුවක් පිළිබඳ සඳහන් වේ. තවද අම්පාර දිස්ත්‍රික්කයෙන් සොයා ගැනුණ සෙල්ලිපියකට අනුව සිංහල කාන්තාවක් දෙමළ පුරුෂයකු සමග විවාහ වී සිටි බව විස්තර කෙරේ. ක්‍රි.ව නවවන සියවස වනවිට මෙරට රාජසභාවේ දෙමළ අධිකාරී නමින් හැඳින්වූ තනතුරෙහි රාජකාරිමය කාර්ය වන්නට ඇත්තේ අනුරාධපුරය සහ ඒ අවට වාසය කළ දෙමළ ජනයාගේ සුභසාධන කටයුතු සොයා බැලීම බව විද්වතුන්ගේ අදහසයි. හතරවන කාශ්‍යප රජතුමාගේ කාලයට අයත් සෙල්ලිපියක දෙමළ අධිකාරී යන වචනය දැක්වේ. ඉතාම වැදගත් කාරණාව වන්නේ බෞද්ධාගමික මුදුන්මල්කඩ සහ රාජ්‍යය උරුමයේ නීත්‍යානුකූල සංකේතය වූ දළදා මාලිගයේ ආරක්ෂාව වේලක්කාර නම් කේරළයෙන් ගෙන්වාගනු ලැබූ හමුදාවක් යටතේ බව සෙල්ලිපි වාර්තාගත කරයි. තවද අනුරාධපුර, පොළොන්නරු ඇතුළුව මෙරට බලයට පත්වූ සෑම රාජධානියකම පාහේ වාස්තු සහ මූර්ති අංග දෙස බලනවිට දකුණු ඉන්දියානු ලක්ෂණ විශේෂයෙන්ම පල්ලව, චෝල, අමරාවතී සම්ප්‍රදායන් පෙන්නුම් කරයි.

වර්තමානයේ දමිළ ජාතිකයන්ගේ කේන්ද්‍රස්ථානය වන යාපනයේ ස්ථාන නාම සමහරක් නිසැකවම සිංහල සම්භවයකින් යුක්ත වන අතර ක්‍රි.ව පළමුවන ශත වර්ෂය දක්වා දිවෙන බෞද්ධ බෞද්ධ විහාරාරාමවල නටබුන් තිබෙන බව පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර සාක්ෂි දරයි (නිසන් සහ ස්ට්රාට්, 2007: පි.10). විශේෂයෙන්ම ශ්‍රී ලංකා ඉතිහාසයේ පුරාණ හා මධ්‍යතන අවධීන්හිදි පාලකයින් රට අභ්‍යන්තරයේ ඇතිවූ බල අරගලවලදි දකුණු ඉන්දීය සහය නිරන්තරයෙන් ලබා ගෙන ඇත. වංසකතාවල පවා ඉලනාග, මොග්ගල්ලාන යනාදී පාලක අවධීන්හිදී සිහසුන වෙනුවෙන් ඉන්දීය හමුදා සේවය ලබාගත් ආකාරය විස්තර කරයි. මෙපමණක් නොව සාහිත්‍යමය මූලාශ්‍රවලට අනුව දෙමළ මෙහෙසියන් සරණ පවා ගැනීමේ සම්ප්‍රදායක් පිළිබඳ වාර්තා වේ. තවද පස්වන සියවසේදී පමණ සිදුවූ දකුණු ඉන්දීය ආක්‍රමණ ජයගෙන බලයට පත්වූ බුද්ද පාරින්ද රජුගේ බිසව බෞද්ධ විහාර ස්ථානයක් වෙනුවෙන් දානමය පිංකම් කරන ලද බවත්, බුද්ද පාරින්දයන්ව 'බුදදස පරිදෙව' ලෙසත් සෙල්ලිපි වාර්තා කරයි. බුදදස යනුවෙන් අදහස් වන්නේ බෞද්ධාගම වැළඳගෙන සිටි බවයි. පුරාණ අවධියේ පමණක් නොව මධ්‍යතන අවධියෙහි නිශ්ශංක අලගක්කෝණාරයන්ගේ හමුදාව සිංහල මෙන්ම දෙමළ හමුදා සෙබළුන්ගෙන් සමන්විත වූ බව නිකාය සංග්‍රහයේ දැක්වේ. සංස්කෘතිමය ඒකීයත්වයට නිදසුන් ප්‍රාථමික මූලාශ්‍රයෝ සපයති. කෝට්ටේ බලකොටුව තුළ සතර දිසාවන්හි අලගක්කෝණාර විසින් ඉදිකරන ලද දේවාල සතරින් වැදගත් වූයේ කතරගම දේවාලයයි. සිංහලයන් විසින් කතරගම දෙවියන් ලෙස ද අදහනු ලබන ස්කන්ධ කුමාර හෙවත් කාර්තිකෙය හින්දූන් විසින් යුද්ධයට අධිපති දෙවියා ලෙස සලකනු ලබයි (සිරිවීර, පි. 322). මෙරට අවසාන රාජධානි සමය ලෙස සැලකෙන මහනුවර අවසාන භාගයේ බලයට පත්වූ නායක්කාර් පෙළපතට අයත් දමිළ පාලකයන් ලංකාව පාලනය කිරීමේදී බෞද්ධ වෙහෙර විහාර ප්‍රතිසංස්කරණ කිරීමට උත්සුක වී ඇත. කාලිංග මාඝගේ ආක්‍රමණය පිළිබඳ එන වාර්තාවේදී නිකාය සංග්‍රහය සහ වංසකතාවල දැක්වෙන ආකාරයට එකී ආක්‍රමණයත් සමග ඇතැම් භික්ෂූන් ආරක්ෂාව පතා දකුණු ඉන්දීය රාජ්‍යවලට පලා ගොස් ඇත. ලියනගමගේ දක්වන ආකාරයට එහිදී වාචිස්සර ප්‍රධාන කොටගත් මහතෙරවරු ඉහළ නැගෙන රැල්ල නොතකා මහ සයුර තරණය කොට පාණ්ඩ්‍ය, චෝළ දේශවලට ගිය බව සඳහන් වේ (ලියනගමගේ, 2010:පි. 24). එපමණක් නොව උපාසකජනාලංකාරයට අනුව පාණ්ඩ්‍ය දේශයට ශ්‍රී ලංකාවෙන් ගිය තෙරවරුන් සඳහා විහාර කරවා උන්වහන්සේලාට අවශ්‍ය සැනසුම සහ සුඛවිහරණය සලසා දුන් අනුග්‍රාහකයකු වූ චෝළගංග නම් පුද්ගලයකු ගැන සඳහන් කරයි (ලියනගමගේ, 2010:පි.24). දෙවන පරාක්‍රමබාහු රජතුමා ශ්‍රී ලංකාව තුළ නැවත බුදු දහම

ප්‍රතිෂ්ඨාපනය කිරීම උදෙසා චෝළ භික්ෂූන් මෙරටට වැඩම කරවන ලද බව චූලවංසය ඇතුළු වංසකතා වලින් ගම්‍ය වේ. එපමණක් නොව ලියනගමගේ දක්වන ආකාරයට කුරුණෑගල රාජධානි පාලක හතරවන පරාක්‍රමබාහු රජු ඉතා ඉහළ තනතුරුවලට ද්‍රවිඩයන් පත්කර ඇත.

උක්ත ඓතිහාසික කාරණා විශ්ලේෂණයෙන් වර්ගවාදී සහ ජාතිවාදී කියවීම් යටතේ ගොඩනැගී ඉතිහාසය විමර්ශනයට ලක් කිරීමෙන් වර්තමානයේ පවතින්නා වූ ජාතිමය හා ආගමික ගැටුම්කාරී විභේදයන් වෙනුවට අතීතයේ පැවතියා වූ වාර්ගික සහජීවනයේ ස්වභාවය පිළිබඳ පැහැදිලි චිත්‍රයක් ලබාගත හැක. සංස්කෘතිමය විවිධත්වය අතීත සමාජ පද්ධතිය කෙතරම් දුරට අවබෝධ කරගනිමින් එකිනෙකාට ගරු කරන සමාජ වටපිටාවක් ගොඩනැගී තිබුණේද යන වග ගම්‍ය වේ.

ප්‍රමුඛ පද ඃ වාර්ගික සහජීවනය, ඉතිහාසකරණය, ඓතිහාසික සවිඥානිකත්වය, පුරාණ යුගය

**ආශ්‍රිත ග්‍රන්ථ**

*මහාවංසය.* (2004). බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

*නිකාය සංග්‍රහය.* (1960). (සංස්.) ඩී.පී.ආර්. සමරනායක, කොළඹඃ ගොඩගේ සහ සහෝදරයෝ.

නිසාන්, ඒ සහ ස්ටිරාට්, ආර්. එල්., ප්‍රජා අනන්‍යතාවන්ගේ උත්පාදනයඃ *ශ්‍රී ලාංකේය සමාජය සහ සංස්කෘතිය පාඨනය කිරීම - තෝරාගත් නිබන්ධන,* (සංස්). සසංක පෙරේරා සහ හරින්ද්‍ර දසනායක, සමාජ සංස්කෘතික තීව්‍ර අධ්‍යයනය සඳහා වන කොළඹ ආයතනය, කොළඹ.

ලියනමගේ, ඒ. (2010). *සමාජය රාජ්‍ය සහ ආගම,* සමාජ විද්‍යාඥයන්ගේ සංගමය, කොළඹ.

සිරිවීර, ඉ. *රජරට ශිෂ්ටාචාරය සහ නිරිතදිග රාජධානි,* දයාවංශ ජයකොඩි සහ සමාගම, කොළඹ.